**ශීර්ෂය 103 - ආරක්ෂක අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශිර්ෂය 103 - ආරක්ෂක අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජුලි 25 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකිවන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 , 149 ,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

-------

**2.1 විසර්ජන ගිණුම**

----------------

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---------------------------

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 19,497.42 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 14,476.71 ක් උපයෝජනයකර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 5,020.71 ක් හෙවත් සියයට 25.75 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 5,676.98 | 5,363.53 | 313.45 | 5.52 |
| මූලධන | 13,820.44 | 9,113.18 | 4,707.26 | 34.06 |
| **එකතුව** | **19,497.42** | **14,476.71** | **5,020.71** | **25.75** |

**2.2** **ආදායම් ගිණුම**

**-----------------**

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම**

**---------------------------------------**

අමාත්‍යාංශය විසින් 2015 වර්ෂය සඳහා ආදායම් සංකේතයක් සඳහා රු.මිලියන 12.50 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 12.95 ක ආදායම් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායම සියයට 3.6 කින් ඉක්මවා ආදායම් රැස්කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| **ආදායම් සංකේතය** | **2015 දෙසැම්බර් 31 දිනට** | | | **ඉක්මවීම ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ඇස්තමේන්තුගත ආදායම** | **තථ්‍ය ආදායම** | **ඉක්මවීම** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| 10-03-07-05 | 12.50 | 12.95 | 0.45 | 3.6 |

**2.3** **අත්තිකාරම් ගිණුම**

**---------------------**

**2.3.1** **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**----------------------------------------------**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

**------------------------------------------------**

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 10301 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** |
| 47.48 | 45.16 | 39.48 | 50.30 | 275.00 | 134.99 |

**2.4** **අග්‍රිම ගිණුම**

**-------------**

අමාත්‍යාංශය යටතේ වූ අග්‍රිම ගිණුම් 02 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 6.88 ක් විය. විස්තර පහත දැක්වේ.

| අග්‍රිම ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
| --- | --- |
| | රු.මිලියන |
| 7002/0000/00/0027/0015/000 | 0.33 |
| 7002/0000/00/0442/0015/000 | 6.55 |
| **එකතුව** | **6.88** |

## 2.5 පොදු තැන්පත් ගිණුම්

අමාත්‍යාංශය යටතේ වන පොදු තැන්පත් ගිණුම් 04 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 97.71 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
| --- | --- |
| | රු.මිලියන |
| 6000/0000/00/0002/0115/000 | 0.81 |
| 6000/0000/00/0013/0072/000 | 45.97 |
| 6000/0000/00/0016/0063/000 | 9.85 |
| 6000/0000/00/0019/0015/000 | 41.08 |
| **එකතුව** | **97.71** |

## 2.6 විගණන නිරීක්ෂණය

ආරක්ෂක අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (i) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ඉඩම් සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ii) | හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 | පවත්වා නොතිබුණි. |
| (iii) | බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 | පවත්වා නොතිබුණි |
| (iv) | දෙපාර්තමේන්තු විසර්ජන (සම්මත වැය) ලෙජරය | මුදල් රෙගුලාසි 447 | යාවත්කාලීන කර නොතිබුණි. |
| (v) | වාහන ලොග් පොත | මුදල් රෙගුලාසි 1645(අ) | යාවත්කාලීන කර නොතිබුණි. |
| (vi) | ණය සහ අත්තිකාරම් ලේඛනය | 1994 අගෝස්තු 10 දිනැති අංක 96 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 09(1) ඡේදය | යාවත්කාලීන කර නොතිබුණි. |

## 3.2 විගණන විමසුම්වලට පිළිතුරු දීම

අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 01 කට 2016 සැප්තැම්බර් 23 දින වන විටත් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. එම විමසුමට අදාළ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු. මිලියන 14,476 ක් වී තිබුණි.

## 3.3 විසර්ජන ගිණුම

### 3.3.1 අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 17 ක් සඳහා සලසා තිබූණු එකතුව රු.මිලියන 16.66 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ආ) වැය විෂයයන් 72 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 25 ක සිට සියයට 99 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 66 ප්‍රකාර මාරු කිරීම් බලපත්‍ර 18 ක් උපයෝගී කරගෙන මුදල් ප්‍රතිපාදන ඒ ඒ වැය විෂයයන් අතර මාරු කර ගෙන තිබුණද, ඉන් එකතුව රු.මිලියන 70.92 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් උපයෝජනය කර නොතිබුණි.

(ඈ) පුනරාවර්තන වැය විෂයයන් 21 කට අදාළව රු.මිලියන 165.47 ක් සහ ප්‍රාග්ධන වැය විෂයයන් 22 කට අදාළව රු. මිලියන 5,917.92 ක් වූ ඉතිරිවීම් සඳහා විසර්ජන ගිණුමේ නිවැරදි හේතු සඳහන් කර නොතිබුණි.

(ඉ) ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ ශික්ෂණ රෝහල ඉදිකිරීම සඳහා රාජ්‍ය බැංකුවකින් විශ්ව විද්‍යාලය විසින් ලබාගෙන තිබුණු ණය මුදල වෙනුවෙන් රු.මිලියන 1,540.97 ක් පොලී ගෙවා තිබුණි. එම වියදම තුළ රු. මිලියන 39.43 ක සාවද්‍ය පොලී වියදමක් ඇතුළත්ව තිබුණි.

(ඊ) ජල බිල්පත් හා විදුලි ගාස්තු ලෙස සමාලෝචිත වර්ෂයේදී ගෙවන ලද රු. මිලියන 2.26 ක් අදාළ වැය විෂය යටතේ ගිණුම්ගත නොකර කුලී හා බදු වැය විෂය යටතේ ගිණුම්ගත කර තිබුණි.

**3.4 පොදු තැන්පත් ගිණුම**

**------------------------**

වර්ෂ 2 ක් ඉක්මවූ (ඉඩම් තැන්පතු හැර) එකතුව රු.මිලියන 20.41 ක් වූ තැන්පතු 15 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි

**3.5 ආදායම් ගිණුම්**

**----------------**

අමාත්‍යාංශ ලේකම් ආදායම් ගණන්දීමේ නිලධාරියා වශයෙන් අංක 10.03.07.05 දරන බලපත්‍ර ගාස්තු ආදායම් සංකේතය සඳහා ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීම, ආදායම් රැස්කිරිම, ගිණුම්ගත කිරිම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්යභාරයන් පැවැරී තිබුණි. එම ආදායම් සංකේතයට අදාළව සිදු කළ නියැදි විගණනයේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ ආදායම් ගිණුම අනුව සමාලෝචිත වර්ෂයේ අවසානයට හිඟහිටි අදායම රු.මිලියන 1.42 ක් වූ අතර එහි වූ ඉකුත් වර්ෂවලට අදාළ හිඟහිටි ආදායම්වල කාල පරාසය නිශ්චිතව දක්වා නොතිබුණි. තවද ඉකුත් වර්ෂවල හිඟ ආදායම් අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළව විගණනයට ඉදිරිපත් කළ ආදායම් ගිණුමේ රු.මිලියන 0.62 ක ආදායම් අඩුවෙන් සඳහන් කර තිබුණි. ඒ අනුව ලැබෙන මුදල් නිසි පරිදි ගිණුම්ගත වන බවට පාලන පරිපාටීන් ක්‍රියාත්මක කිරීමේ දුර්වලතාවයන් පවතින බව නිරීක්ෂණය විය.

(ඇ) 2002 ජුලි 17 දිනැති අංක 01/2002 දරන රාජ්‍ය මුදල් ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු චක්‍රලේඛයේ 07 ඡේදය ප්‍රකාරව ආදායම් පිළිබඳ කාර්යසාධනය ඇතුළත් වාර්තා ත්‍රෛයිමාසිකව පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) ඉහත සඳහන් චක්‍රලේඛයේ (iii) ඡේදය ප්‍රකාරව හා 2015 දෙසැම්බර් 11 දිනැති අංක පීඑෆ්ඩී/04/08/01/59/පොදු දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ගාස්තු අයකිරීම සංශෝධනය කිරීම සඳහා වූ චක්‍රලේඛයේ 02(i) ඡේදය ප්‍රකාරව, ආර්ථික තත්ත්වයේ වෙනස්කම් සැලකිල්ලට ගනිමින් නොයෙකුත් සේවාවන් සඳහා අයකරනු ලබන ගාස්තු කාලානුරූපීව සංශෝධනය කළ යුතුව තිබුණි. 1996 අංක 22 දරන තුවක්කු (සංශෝධන) පනත යටතේ අයකරනු ලබන තුවක්කු බලපත්‍ර ගාස්තු සහ පුපුරණ ද්‍රව්‍ය (සංශෝධන) පනත යටතේ අයකරනු ලබන පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර ගාස්තු 2000 වර්ෂයෙන් පසු කිසිදු සංශෝධනයක් සිදුකර නොතිබුණි.

## 3.6 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

---------------------------------------

විෂය අංක 10301 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය අනුව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.මිලියන 9.89 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 30 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) ස්ථාන මාරුවී ගිය නිලධාරීන් / සේවකයින් 114 දෙනෙකුගෙන් හිඟහිටි රු.මිලියන 3.62 ක් මුදලක් අයවිය යුතුව තිබුණි. 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි. එම හිඟහිටි ණය ශේෂයෙන් නිලධාරීන්/ සේවකයින් 101 දෙනෙකුගෙන් හිඟහිටි රු. මිලියන 2.72 ක ණය ශේෂය වර්ෂ 05 ක සිට වර්ෂ 30 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණි.

(ඇ) මියගිය හා විශ්‍රාම ගිය නිලධාරීන් / සේවකයින් 48 දෙනෙකුගෙන් රු. මිලියන 2.87 ක් අයවිය යුතුව තිබුණි. එයින් වසර 10 ක සිට වසර 24 ක් දක්වා කාලයක සිට මියගිය හා විශ්‍රාමගිය නිලධාරීන් / සේවකයින් 23 දෙනෙකුගෙන් රු. මිලියන 0.78 ක් අයවිය යුතුව තිබුණි. මියගිය හා විශ්‍රාමගිය නිලධාරීන් පිළිබඳ ප්‍රමාණවත් දත්ත තොරතුරු පද්ධතියක් අමාත්‍යාංශය සතුව නොපැවතුණි.

(ඈ) වැඩ තහනමට ලක්වූ නිලධාරීන් / සේවකයින් 10 දෙනෙකුගෙන් රු. මිලියන 0.34 ක ණය ශේෂයක් හිඟහිටිව පැවැතුණි. එයින් රු. මිලියන 0.13 ක් නිලධාරීන්/ සේවකයින් 04 දෙනෙකුගෙන් වර්ෂ 10 කට වැඩි කාලයක සිට අයවිය යුතුව තිබුණි.

(ඉ) සේවය අතහැර ගිය නිලධාරීන් / සේවකයින් 27 දෙනෙකුගෙන් රු. මිලියන 2.57 ක් අයවිය යුතුව තිබුණි. එයින් රු. මිලියන 1.68 ක් නිලධාරීන්/ සේවකයින් 19 දෙනෙකුගෙන් වසර 10 කට වැඩි කාලයක සිට හිඟහිටව පැවැතුණි.

(ඊ) අයවීම් නතර වී තිබුණු රු. මිලියන 0.50 ක ණය ශේෂයක් සැසඳුම් ප්‍රකාශයේ දක්වා තිබුණි. එයින් රු. මිලියන 0.29 ක් අයවිය යුතු පාර්ශවය සිවිල් ආරක්ෂක ලෙස සඳහන් කර තිබුණි. එම ණය මුදලට අදාළ නිලධාරීන්/ සේවකයන් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. ඉතිරි ණය ශේෂය වූ රු. මිලියන 0.21 ක ණය ශේෂය වර්ෂ 12 ක සිට වර්ෂ 16 ක් අතර කාල පරාසයක් සිට පැවැත එමින් තිබුණි.

(උ) සාමාජික ණය ලේඛනය අනුව නිලධාරීන් දෙදෙනෙකුගෙන් එකතුව රු. මිලියන 0.32 ක ණය ශේෂයන් සමාලෝචිත වර්ෂයේ සැසඳුම් ප්‍රකාශනයෙන් අත්හැරී තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය වෙත ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන් දෙදෙනෙකුගෙන් එකතුව රු.මිලියන 0.65 ක ණය ශේෂයක් අයකර ගත යුතුව තිබුණි. 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර එම ණය ශේෂ අමාත්‍යාංශය වෙත 2016 ජුනි 14 දින වන විටත් පවරාගෙන නොතිබුණි.

**3.7 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

---

**(අ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

---

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව, ජාතික අයවැය දෙපාර්තමේන්තුව හා විගණකාධිපති වෙත 2015 ජුනි 18 දින ප්‍රමාදයක් සහිතව ඉදිරිපත් කර තිබුණි.

**(ආ) වාර්ෂික කාර්යසාධන වාර්තාව**

---

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගතකළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ එම වාර්තාව 2016 ජුලි 29 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**3.8 වත්කම් කළමනාකරණය**

---

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2015 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2015 මාර්තු 31 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, අමාත්‍යාංශය විසින් 2016 ජුනි 30 දින වන විටත් අංශ හයකට අදාළ එම වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ii) සමීක්ෂණයට අදාළව අංශ 11 ක් හඳුනාගෙන තිබුණු නමුත් එක් එක් අංශය යටතේ වූ උප ඒකක සංඛ්‍යාව විගණන දිනය වූ 2016 ජුලි 07 දින විටත් නිශ්චිතව දක්වා උපලේඛනගත කර නොතිබුණු බැවින් සමීක්ෂණය සිදුවිය යුතු සියළු උප ඒකකවල සමීක්ෂණය සිදු වූවාද යන්න විගණනයේදී හඳුනා ගැනීමට නොහැකි විය.

(iii) 2015 වර්ෂයට අදාළ විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සමීක්ෂණ වාර්තා නියැදියකට අනුව අංශ 7 කට අදාළව, ප්‍රමාණාත්මක වටිනාකමක් සහිත භාණ්ඩ ඒකක 11 ක ඌනතාවයක් පැවති බව අමාත්‍යාංශය විසින් හඳුනාගෙන තිබුණි.

(iv) අකුරේගොඩ ත්‍රිවිධ හමුදා හා ආරක්ෂක මූලස්ථානයේ ඉදිකිරීම් ව්‍යාපෘතියේ සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව අපහරණය කළයුතු යැයි හඳුනාගෙන තිබූ අයිතම 24088 ක්ව පැවැතුණි. එම භාණ්ඩවල ව්‍යාපෘති වැඩ බිම තුළ ප්‍රයෝජනයට ගත් කාලය සමීක්ෂණ වාර්තා මඟින් හඳුනාගෙන නොතිබුණි. තවද එහි පිරිවැය හෝ සමීක්ෂණ දිනට වටිනාකම පිළිබඳව විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(v) සමාලෝචිත වර්ෂයට අදාළව විගණනයට ඉදිරිපත් කළ භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව ඉන්වෙන්ට්‍රි ලේඛන විධිමත් ලෙස යාවත්කාලීන නොකළ අවස්ථා 10 ක්ද, ඉන්වෙන්ට්‍රි ලේඛණ පවත්වාගෙන නොතිබුණු අවස්ථා 3 ක්ද, අංශ 3 ක ඉන්වෙන්ට්‍රි

භාණ්ඩ භාරව වගකිවයුතු නිලධාරීන් පත්කර නොතිබීම හේතුවෙන් අවස්ථා 3 කදී සමීක්ෂණය සිදුකර නොතිබුණි. පරිගණක අංශයේ පරිගණක හා උපාංග අයිතම 86 ක් සඳහා නිකුත්කිරීම් නියෝග නොතිබුණු අවස්ථාද පැවැතිණි. මේ නිසා අමාත්‍යාංශයේ ඉන්වෙන්ට්‍රි පාලනය සතුටුදායක මට්ටමක නොතිබුණු බව නිරීක්ෂණය විය.

(vi) ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශය මුදල් රෙගුලාසි 757 ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**(ආ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

**----------------------------------------**

අමාත්‍යාංශය විසින් මෝටර් වාහන 03 ක් අවිධිමත් ලෙස හිටපු රජයේ නිලධාරීන් දෙදෙනෙකු වෙත මුදාහැර තිබුණු බව නිරීක්ෂණය විය.

**(ඇ) බේරුම් නොකළ බැරකම්**

**---------------------------**

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(i) අමාත්‍යාංශය විසින් 2015 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම්, විසර්ජන ගිණුම අනුව රු.මිලියන 58.38 ක් සහ නියැදි විගණන පරික්ෂාවට අනුව හඳුනාගත් විසර්ජන ගිණුමේ ඇතුළත් නොවූ රු.මිලියන 8.37 ක් වශයෙන් එකතුව රු.මිලියන 66.75 ක බැරකම් පැවතුණි. එම බැරකම්වල කාල විශ්ලේෂණයක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේදී මුදල් රෙගුලාසි 94 විධිවිධානවලට පටහැනිව වැය විෂයයන් 07 කට අදාළව ශුද්ධ ප්‍රතිපාදන ඉක්මවා එකතුව රු.මිලියන 9.04 ක බැරකම්වලට එළඹ තිබුණි.

**3.9 අනුකූල නොවීම්**

**--------------------**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

**-----------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහකර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | | | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|---|
| | | | රු. මිලියන | |
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| | (i) | මුදල් රෙගුලාසි 104(4) | 12.31 | ආරක්ෂක මූලස්ථානය ඉදිකිරීම් ව්‍යාපෘති ගොඩනැගිල්ලක 2014 පෙබරවාරි 15 දින සිදු වූ හදිසි ගින්න සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. |
| | (ii) | මුදල් රෙගුලාසි 218 (2) | 0.42 | අමාත්‍යාංශයේ විදුලි බිල්පත් මුදල් රෙගුලාසිවල විධිවිධාන ප්‍රකාරව නියමිත කාලවකවානුවල නොගෙවීම නිසා දඩ පොලී ගෙවා තිබුණි. |
| | (iii) | මුදල් රෙගුලාසි 756, 757 හා 1647(ආ) | | 2015 වර්ෂයේ හා ඉකුත් වර්ෂවලදී අමාත්‍යාංශය සතු වාහන සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණයන් පවත්වා නොතිබුණි. |
| | (iv) | මුදල් රෙගුලාසි 1645(ආ), (ඇ) සහ 1646 | | සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය සතු සංචිත වාහන 155 කට අදාළව දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සෑම මාසයක් අවසාන වී එළඹෙන මාසයේ 15 දිනට පෙර විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| | (v) | මුදල් රෙගුලාසි 702(3) | - | අකුරේගොඩ ව්‍යාපෘතිය හැර අමාත්‍යාංශය විසින් සංවර්ධන වැඩ, සැපයුම් හා සේවා සම්බන්ධයෙන් එළඹෙන ගිවිසුම්වල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

**(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය**
**------------------------------**

| | | | |
|---|---|---|---|
| (i) | 5.4.11 මාර්ගෝපදේශය | 2.19 | බදු ඉන්වොයිස්පත් නොමැතිව භාණ්ඩ හා සේවා වෙනුවෙන් රු. මිලියන 2.19 ක් වූ එකතු කළ අගය මත බදු (VAT) පෞද්ගලික සමාගම් 03 ක් වෙත ගෙවා තිබුණි. |
| (ii) | 5.4.12 මාර්ගෝපදේශය | - | රණවිරු අර්ධ නිවාස ව්‍යාපෘතියේ මාසිකව සිදු කරනු ලබන ගෙවීම් තුළ වන එකතු කළ අගය මත බදු පිළිබඳව, ඊළඟ මාසයේ 15 දින හෝ එදිනට පෙර, දේශීය අදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලබන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (iii) | 8.9.1 මාර්ගෝපදේශය | 96.73 | රණවිරු අර්ධ නිවාස ව්‍යාපෘතිය වෙනුවෙන් ලිඛිත ගිවිසුම්වලට එළඹ නොතිබුණු සැපයුම්කරුවන් 08 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 96.73 ක් වූ මිලදී ගැනීම් සිදු කර තිබුණි. |

## 3.10 දේශීය මුල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
**----------------------------------------------------**

දේශීය මුල්‍යකරණ මගින් ක්‍රියාත්මක කර තිබුණු ව්‍යාපෘති සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරික්ෂණවලදී අනාවරණය වූ අඩුපාඩු පහත දැක්වේ.

**(අ) අකුරේගොඩ ආරක්ෂක මූලස්ථානය ඉදිකිරීම් ව්‍යාපෘතිය**
**----------------------------------------------------------**

මේ සම්බන්ධයෙන් පහත සදහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මුදල් රෙගුලාසි 03 හා 04 ප්‍රකාර ආර්ථික, මූල්‍ය, පාරිසරික හා සමාජ අවශ්‍යතා සාධකයන් ඇතුළත්වූ ශක්‍යතා අධ්‍යයනයක්, පාරිසරික ගැටළු අවම කිරීමේ සැලැස්මක් හා පාරිසරික බලපෑම පිළිබඳ තක්සේරුවක් සිදුකිරීමකින් තොරව මෙම ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණි. ව්‍යාපෘතිය වෙනුවෙන් මුදල් රෙගුලාසි 20 ප්‍රකාර මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබුණි.

(ii) මෙම ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 25,401.82 ක් සඳහා 2011 වර්ෂයේදි අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. එම ඇස්තමේන්තුවේ වූ ව්‍යාපෘතියේ අදියර I යටතේ රු. මිලියන 43,176.32 ක්ද, අදියර II යටතේ රු.මිලියන 10,125 ක්ද හා තවත් යටිතල පහසුකම් කාර්යයන් 02 ක් ඇතුළුව මුල් ඇස්තමේන්තුව රු. මිලියන 55,602.92 ක් දක්වා සියයට 95 කින් ඇස්තමේන්තු සංශෝධනය කර තිබුණි. නමුත් එම සංශෝධනයන් සඳහා විගණන දිනය වූ 2016 මැයි 30 දින වන විටත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(iii) උක්ත ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය මුදල ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය පිහිටුවා තිබුණු ඉඩම 2010 සහ 2011 වර්ෂවලදී විදේශීය සමාගම් දෙකකට විකුණා ලද රු.මිලියන 19,817.31 ක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149 ව්‍යවස්ථාවට පටහැනිව අවස්ථා 3 කදී මහා භාණ්ඩාගාරය විසින් අමාත්‍යාංශය වෙත ලබා දී තිබුණි. අමාත්‍යාංශය විසින් සපයන ලද ලේඛන අනුව මෙම ගනුදෙනු සඳහා රාජ්‍ය බැංකුවක ගිණුමක් යොදාගෙන අදාළ මුදල් භාණ්ඩාගාර බිල්පත්‍ර හා ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලය තුළ ඒ සඳහා රු.මිලියන 5,506.77 ක පොලියක් උපයාගෙන තිබුණි. එම ආයෝජනයෙන් ව්‍යාපෘති කටයුතු සඳහා රු.මිලියන 12,265.98 ක් වැය කර තිබුණු බව ගණකාධිකාරිවරයා විසින් තහවුරු කර තිබුණි. පසුව භාණ්ඩාගාරයේ නියමය පරිදි 2015 ජනවාරි 19 දින ගිණුමේ රඳවාගෙන තිබූ රු. මිලියන 13,058.09 ක් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර තිබුණි.

(iv) සමාලෝචිත වර්ෂයේ ආරම්භය වන විට ව්‍යාපෘතියේ සමුච්චිත වියදම රු.මිලියන 11,806.26 ක් බව ව්‍යාපෘති කාර්යාලය වාර්තා කර තිබුණි. අමාත්‍යාංශයේ ගණකාධිකාරී (මුදල්) ගේ වාර්තාව අනුව එය රු. මිලියන 12,265.98 ක් වශයෙන් සඳහන් කර තිබුණි. එම වෙනස සම්බන්ධයෙන් අදාළ සැසඳීම් සිදු කර නොතිබුණි.

(v) ඉකුත් වර්ෂවල වැය කර තිබුණු රු.මිලියන 3,383.18 ක් ව්‍යාපෘතියේ වියදම් ලෙස එක් එක් වර්ෂයේදි ගිණුම්ගත කර නොතිබුණි. එම වියදම් සමාලෝචිත වර්ෂයේ මාර්තු මාසයේදී ප්‍රාග්ධන වියදම් යටතේ ගිණුම්ගත කර තිබුණද, එම වියදම තහවුරු කර ගැනීම සඳහා පිළිගත හැකි සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(vi) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ව්‍යාපෘති කාර්යයන් 11 ක් යටතේ රු. මිලියන 22,377.68 ක ප්‍රතිපාදන අවශ්‍යතාවයක් හඳුනාගෙන සැලසුම් කර තිබුණු කාර්යය සඳහා සමාලෝචිත වර්ෂයේදී ප්‍රාග්ධන වැය විෂයක් යටතේ රු. මිලියන 7,980.90ක ප්‍රතිපාදනයක් සලසා තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂයේදී ඉන් රු.මිලියන 1,761.29 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

(vii) ව්‍යාපෘතිය ගිනි හානිවලින් ආරක්ෂාවීමට ගිනි ආරක්ෂක වැඩපිළිවෙලක් ස්ථාපිත කර නොතිබුණි. 2014 පෙබරවාරි 15 දින ඇති වී තිබූ ගිනි උවදුරෙන් රු. මිලියන 12.31 ක රජයේ දේපළවලට හානියක් සිදු වී තිබුණි. ඉන් ඉදිකිරීම් ව්‍යුහයන්ට රු. මිලියන 6.53 හානියක් සිදු වී තිබුණි.

(viii) උපදේශක සමාගම් තෝරා ගැනීමට අදාළව 2007 වර්ෂයේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශන සංග්‍රහයේ විධිවිධාන නොසළකා තරඟකාරී ලංසු කැඳවීමකින් බැහැරව අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත 2011 වර්ෂයේ සිට වාස්තු විද්‍යාත්මක සේවා ඉටු කර ගැනිම සඳහා වාස්තු විද්‍යා පෞද්ගලික සමාගමකට රු.මිලියන 606.30 කට

කොන්ත්‍රාත්ව පවරා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඒ සඳහා රු.මිලියන 490.57 ක් දක්වා ගෙවීම් කර තිබුණද ලිඛිත ගිවිසුමකට එළඹ නොතිබුණි. මෙම පෞද්ගලික ආයතනය වෙත ව්‍යාපෘතියේ කටයුතු සඳහා ප්‍රමාණවත් වෘත්තීය නිපුණත්වයක් හා ධාරිතාවයක් නොමැති බව ව්‍යාපෘති කළමණාකරන ඒකකය හා ඉදිකිරීම් කළමණාකරන ඒකකය විසින් හඳුනාගෙන තිබුණි. ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග නොගෙන සමාලෝචිත වර්ෂයේදී තවදුරටත් සේවය ලබාගෙන තිබුණි.

(ix) ඉංජිනේරු උපදේශක සේවාව සඳහා ඇස්තමේන්තුගත වටිනාකමෙන් සියයට 4.5 ගෙවීමේ පදනම මත රු. මිලියන 1,556.9 කට මධ්‍යම උපදේශක ඉංජිනේරු කාර්යාංශය සමඟ ලිඛිත ගිවිසුමකට එළඹ තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.මිලියන 1,199 ක් ගෙවා තිබුණි. එය ව්‍යාපෘතියේ ගිවිසගත් උපදේශක ගාස්තුවලින් සියයට 77 ක ප්‍රමාණයක් වී තිබුණි.

(x) 2012 අප්‍රේල් මාසයේදී ආරම්භ කර තිබුණු ව්‍යාපෘතියේ සමස්ත ඉදිකිරීම්වල ප්‍රගතිය සියයට 35 ක මට්ටමක පැවතුණි. සමස්ත ව්‍යාපෘති වැඩ සැලැසුමක් සකස් කර ඒ අනුව වැඩ මෙහෙයවීමක් සිදු කර නොතිබුණි. මාස 18 (2014 – 2015) කට ආසන්න කාලයක් ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු නැවතී තිබීම, වැඩ ඉලක්ක හඳුන්වා දී ඒ අනුව අපේක්ෂිත කාල රාමුවක් තුළ ඉදිකිරීම් නිම නොකිරීම, උපදේශක සේවා සැපයීමේ හා ප්‍රසම්පාදන කටයුතුවල ප්‍රමාදයන් හේතුවෙන් ව්‍යාපෘති ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වී තිබුණි.

(xi) කොළඹ දිස්ත්‍රික්කය තුළ ආරක්ෂක අමාත්‍යාංශය ඇතුළු ත්‍රිවිධ හමුදාව හා එයට අදාළ අනෙකුත් ආයතන සඳහා කුලී පදනම මත ලබාගත් ස්ථාන 23 කට වාර්ෂිකව රු. මිලියන 326 ක පමණ අතිරේක වියදමක් කර තිබුණි.

**(ආ) පුද්ගල අනන්‍යතා ලේකම් කාර්යාල ගොඩනැගිලි ව්‍යාපෘතිය**

-------------------------------------------------------------

මහල් 20 කින් යුත් පුද්ගල අනන්‍යතා ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2012 ජූලි මාසයේ සිට වර්ෂ 03 කින් නිම කිරීමේ පදනම මත ජාත්‍යන්තර කොන්ත්‍රාත් සමාගමක් සමඟ අනුබද්ධ ඉදිකිරීම් සමාගමක් වෙත පවරා තිබුණි. මේ සඳහා පෞද්ගලික බැංකු 02 ක් හා රාජ්‍ය බැංකු 02 ක් මඟින් ඉදිකිරීම් කාලසීමාව තුළ ණය ආපසු නොගෙවීමේ වසර තුනේ සහන කාලයක් සහ 2015 අගෝස්තු මාසයේ සිට වර්ෂ 15 කින් ආපසු ගෙවීමේ පදනම මත රු. මිලියන 7,550 ක ණයක් ලබා ගැනීමට 2012 වර්ෂයේදී ගිවිසුම්වලට එළඹ තිබුණි.

ඉදිකිරීම් අවසන් කළ 2015 ජූලි 30 දින වන විට ඉහත බැංකු 04 මඟින් ලබාගෙන තිබූ ඒකාබද්ධ ණය ප්‍රමාණය (ප්‍රාග්ධනගත කළ පොලියද සමඟ) වූ රු.මිලියන 8,295 ක් සහ ගිවිසුම පරිදි ගෙවිය යුතුව තිබූ පොලිය රු.මිලියන 7,004 ක් වී තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අදාල බැංකුවලින් ණය ලබාගැනීම සහ ගිවිසුම්වලට එළඹීම සඳහා අමාත්‍යාංශ ලේකම්වරයා වෙත අධිකාරී බලය පැවරුනු ආකාරය සහ ණය ලබා ගැනීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය හා එකඟතාව සම්බන්ධ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ ගෙවා තිබූ ණය ආපසු ගෙවීම් 3001 වැය විෂය යටතේද , පොලී ගෙවීම් 1701 වැය විෂය යටතේද ගිණුම්ගත කළ යුතු වුවත්, එය 2502 වැය විෂය යටතේ ගිණුම්ගත කර තිබුණි. මේ රජය විසින් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණු ණය වාරික ප්‍රමාණය හා පොලිය ජනරජයේ මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය අවසාන වන විට ලබාගත් ණයට අදාළව ණය හා පොලී වශයෙන් රු. මිලියන 14,752.75 ක් නිරවුල් කළ යුතුව තිබුණි. එම බැරකම විසර්ජන ගිණුමේ බැරකම් යටතේ දක්වා නොතිබුණි. තවද ණය වාරික ගෙවීම මඟින් පැන නඟින ජංගම නොවන වත්කම් අගය වූ රු.මිලියන 267.61 ක අගය විසර්ජන ගිණුමේ ජංගම නොවන සංචලන වාර්තාවේ ඇතුළත් කර නොතිබුණි.

(iv) ඉහත සඳහන් ව්‍යාපෘතියේ උපදේශක ලෙස කටයුතු කළ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු.මිලියන 63.82 ක උපදේශන ගාස්තුව විධිමත් අධිකාරියකින් තොරව රු.මිලියන 61.26 ක් ලෙස සංශෝධනය කර ලියන ලද චෙක්පත විගණන දිනය වූ 2016 අප්‍රේල් 26 දින වන විටත් අත රඳවාගෙන තිබුණි. එම බැරකම සම්බන්ධයෙන් උපදේශක ආයතනය විසින්ද හිමිකම් පෑම සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

**(ඇ) උපාය මාර්ගික ආරක්ෂක සන්නිවේදන ජාලය**

---

ත්‍රිවිධ හමුදා අතර කළාපය තුළ පවතින නවීන සන්නිවේදන පද්ධතියට සමාන අයුරින් අඛණ්ඩ ආරක්ෂාකාරී හා විකල්ප සංනිවේදන ජාලයක් සැපයීම ඇතුළුව තවත් මූලික අරමුණු 08 ක් ඉටුකර ගැනිම සඳහා රු.මිලියන 1,192 ක් වූ ඇස්තමේන්තුවක් මත 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වර්ෂ 2 ක ව්‍යාපෘති කාලයක් තුළ ඉටු කළ යුතුව තිබුණි. එම ඇස්තමේන්තුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.මිලියන 1,297.25 දක්වා ද, නැවත එය අසාමාන්‍ය ලෙස රු.මිලියන 1,854 දක්වා ද, සංශෝධනය කර තිබුණි. මේ හේතුවෙන් පෞද්ගලික ආයතනයට ගෙවන උපදේශන සේවා ගාස්තු ඉහළ යාමේ ප්‍රවණතාවයක් පැවතිණි. සමාලෝචිත වර්ෂයේ අවසාන වන විට ව්‍යාපෘති කාලය වසර එකහමාරක් ගතවී තිබුණ ද, 2016 ජුලි 25 දින වන වටත් රු.මිලියන 22.03 ක් වැය කර තිබුණු අතර ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 2 ක මට්ටමක පැවතුණි. සන්නිවේදන කුළුණු ඉදිකළ පසුව සවිකළ යුතු ජෙනරේටර් යන්ත්‍ර 22 ක් සමාලෝචිත වර්ෂය තුළ නිෂ්කාර්යව පැවතුණි. සන්නිවේදන කුළුණු 22 ක ඉදිකිරීම් මූලික කාර්ය ආරම්භ නොවීම, ව්‍යාපෘති කාර්යසාධනය ප්‍රාථමික අදියරයන්හි පැවතීම, අදාළ ව්‍යාපෘතිය සැලසුම් කළ කාලය හා පිරිවැය නිම කිරීමට නොහැකි වීමත් නිසා ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵල ලබාගැනීම අවිනිශ්චිත මට්ටමක පැවතුණි.

**(ඈ) කොළඹ නගර සංවර්ධන ව්‍යාපෘතිය**

---

සමාලෝචිත වර්ෂයේ මූලධන වැය විෂයක් යටතේ කොළඹ නගර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 10 ක ප්‍රතිපාදන සළසා තිබුණත්, කිසිදු කාර්යයක් සමාලෝචිත වර්ෂයේදී ඉටු කර නොතිබුණු අතර වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ සහ ප්‍රසම්පාදන සැලැස්මේ එම කාර්යයන් ඇතුළත් කර නොතිබුණි. එම ප්‍රතිපාදනයෙන් රු. මිලියන 0.77 ක් ගම්පහ දිස්ත්‍රික්කයේ බියගම පිහිටි ව්‍යායාම මංතීරු අලුත්වැඩියා සඳහා වැය කර තිබුණි.

**(ඉ) රණවිරු අර්ධ නිවාස ව්‍යාපෘතිය**

---

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අමාත්‍යාංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ 5.1.1.5.5 ඡේදයේ ව්‍යාපෘතියට අදාළව ක්‍රියාකාරකම් දැක්වීමේදී වාර්ෂිකව සලසන ලද ප්‍රතිපාදනය දක්වා තිබුණි. නමුත් කාර්තුමය පදනමට ඉලක්ක පිහිටුවීමක් හෝ කාලසීමා නිර්ණය කිරීමක් සඳහන් කර

නොතිබුණි. ඉදිරිපත් කළ යුතු කාර්යසාධන සාධකය ලෙස, තෝරාගත් ප්‍රතිලාභීන් සංඛ්‍යාව දක්වා තිබූ අතර ඉදිකිරීම් නිම කළ නිවාස සංඛ්‍යාව හෝ නිවාස ලබා දුන් ප්‍රතිලාභීන් සංඛ්‍යාව දක්වා නොතිබුණි.

(ii) ව්‍යාපෘති මෙහෙයුම් මධ්‍යස්ථානය ඉදිරිපත් කරන ලද වැය විස්තර හා වැය ලෙජරයේ සටහන් කරන ලද වියදම් පරික්ෂාවේදී මාස 06 කට අදාළව රු.මිලියන 3.11 ක් වැය ලෙජරයේ වැඩියෙන්ද, මාස 03 කට අදාළව රු.මිලියන 125.54 ක වියදම් වැය ලෙජරයේ අඩුවෙන්ද වශයෙන් සටහන් කර තිබුණි.

(iii) ව්‍යාපෘතියට අදාළ රු. මිලියන 1,000 ක්වූ ප්‍රතිපාදනයෙන් සමාලෝචිත වර්ෂයේ ව්‍යාපෘති වියදම් ලෙස අමාත්‍යාංශය විසින් රු. මිලියන 136.93 ක් වැයකර තිබුණි. එය ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව හරහා මෙහෙයුම් අදියර 5 ක් යටතේ වාර 14 කදී ප්‍රසම්පාදන සිදුකර තිබුණි. මෙම කාර්ය වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමේදී ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් ලෙස ඇතුළත් කර නොතිබුණි.

(iv) නිසි කළමනාකරණයක් යටතේ කටයුතු නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ව්‍යාපෘතිය වෙනුවෙන් ලද ප්‍රතිපාදනවලින් රු.මිලියන 190 ක් හෙවත්, සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 19 ක ප්‍රමාණයක් උපයෝජනය කිරීමට නොහැකි වී තිබුණි.

(v) ව්‍යාපෘතියට අදාළව වෙනම ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් අමාත්‍යාංශය විසින් පවත්වා නොතිබුණු අතර, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ බලය පැවරී ඇති අංශය ලෙස ක්‍රියාකාරී සැලැස්මට අනුව පරිපාලන අංශය හඳුනාගෙන තිබුණි. නමුත් එම අංශයේ කිසිදු නිලධාරියෙකුට ලිඛිතව ව්‍යාපෘති රාජකාරී පැවරීම විගණන දිනය වූ 2016 සැප්තැම්බර් 26 දින වන විටත් ලබා දී නොතිබුණි.

**3.11 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

**ගැලපුම් කළයුතු ශේෂ**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආරක්ෂක අමාත්‍යාංශය විසින් 2015 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශවල දැක්වුණු ගැලපුම් පිළිබඳ විග්‍රහයට අනුව අනාවරණය වූ නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ මාස 06 කට වැඩි වර්ෂ 01 කට අඩු කල් ඉකුත් වූ රු.මිලියන 0.11 ක් වූ චෙක්පත් 12 ක සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළ ගිනි අවි හා පුපුරණ ද්‍රව්‍ය ආදායම් ලෙස චෙක්පත් 04 කින් ලද රු. මිලියන 0.23 ක් සමාලෝචිත වර්ෂයේ මුදල් පොතේ සටහන් කර තිබුණි. නමුත් එම ආදායම ලැබීම් ලේඛනවලින් අත්හැරී තිබුණි.

**3.12 අධිකාර බලය නොමැති වූ ගනුදෙනු**

2015 අංක 15 දරන විසර්ජන (සංශෝධන) පනතේ සිවිල් ආරක්ෂක සේවයේ නියුතු සාමාජිකයන්ගේ මාපියන්ට රණවිරු මාපිය කැපකරු දීමනා ගෙවීමට ප්‍රතිපාදන සලසා නොතිබුණි. 2015 ජනවාරි 29 දිනට පසුව අමාත්‍යාංශයේ වැය ලෙජරය අනුව ගිණුම්ගත කරන ලද රු. මිලියන 29.93 ක වියදම සම්බන්ධයෙන් අධිකාරී බලය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**3.13 පාඩු හා හානි**

---------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) 2013 වර්ෂයේදී අනතුරට පත් අමාත්‍යාංශයට අයත් මෝටර් වාහනයකට සිදුව තිබුණු අලාභ හානියක් රු.මිලියන 0.38 ක් අඩුවෙන් විසර්ජන ගිණුමේ සඳහන් කර තිබුණි. සිදු වූ අලාභය සම්බන්ධයෙන් රු.මිලියන 1.10 ක හිමිකම රක්ෂණ ආයතනයෙන් අයකර ගැනීමට, පරීක්ෂණ වාර්තාව අනුව අදාළ නිලධාරියාගෙන් අය කළ යුතු රු.මිලියන 0.15 ක අලාභය අයකර ගැනීමත් 2016 සැප්තැම්බර් 26 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) 2006 වර්ෂයේදී අනතුරට පත්ව තිබුණු අමාත්‍යාංශයට අයත් ජීප් රථයකට සිදු වී තිබුණු අලාභ හානියෙන් රු.මිලියන 0.23 ක් විගණන දිනය වූ 2016 සැප්තැම්බර් 26 දින වන විට නිලධාරීන්ගෙන් අයකර ගෙන තිබුණි. නමුත් ඒ පිළිබඳව සටහන් විසර්ජන ගිණුමේ සඳහන් කර නොතිබුණු අතර පොතෙන් කපා හැරීමට නියම වූ රු. මිලියන 0.90 ක් කපා හැරීමටද කටයුතු කර නොතිබුණි.

**3.14 විසඳා නොතිබුණු විගණන ඡේද**

-----------------------------------

අමාත්‍යාංශයට අදාළව 2014 වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ 3.12 (ඊ) ඡේදයෙන් පෙන්වා දී තිබුණු ත්‍රිවිධ හමුදාව සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව බාහිර පාර්ශවයන්ට සපයනු ලබන සේවාවන්ගෙන් උපයනු ලබන ආදායම් ඒකාබද්ධ අරමුදලට බැර කිරීම සම්බන්ධව 2015 ජුනි 22 දින ආරක්ෂක අමාත්‍යාංශය සහ එයට අයත් ආයතන සමඟ ගෙන තිබූ ඒකාබද්ධ තීරණය පිළිබඳ 2015 සැප්තැම්බර් 25 දින විගණකාධිපති වෙත දැනුම් දී තිබුණි.කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂයේදී උපයන ලද ආදායම් හා ඒවා බැරකිරීම් පිළිබඳ විස්තර විගණනය වෙත වාර්තාකර නොතිබුණි.

**3.15 කළමනාකරණ දුර්වලතා**

----------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) අමාත්‍යාංශයට අයත් ඉඩම් සම්බන්ධ විස්තර 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය පරිදි ස්ථාවර වත්කම් ලේඛනයේ සහ ලෙජරයේ සටහන් පවත්වාගෙන ගොස් නොතිබුණු හෙයින් අමාත්‍යාංශයට අයත් ඉඩම් සංඛ්‍යාව, භූමි ප්‍රමාණය හා ඒවායේ සාධාරණ තක්සේරු අගය හඳුනාගත නොහැකි විය. විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව අමාත්‍යාංශය විසින් හඳුනාගෙන තිබූ ඉඩම් ඒකක 05 ක් සම්බන්ධයෙන් අයිතිය තහවුරු කළ හැකි ලිපි ලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. තවද විගණන දිනය වන විට ඉඩම් පරිපාලනය සඳහා විධිමත් වැඩපිළිවෙලක් අමාත්‍යාංශය විසින් හඳුනාගෙන නොතිබුණි.

(ආ) ආරක්ෂක අමාත්‍යාංශය සතු ගර්හිත වාහන 06 ක් ආරක්ෂක ලේකම්ගේ අනුමැතිය මත තක්සේරු මිලට වඩා අඩුවෙන් ඉදිරිපත් වූ මිලකට විකුණා තිබුණි. එසේ තක්සේරු මිලට වඩා අඩු මිලකට වාහන විකිණීම නිසා රු. මිලියන 0.43 ක අලාභයක් ඒකාබද්ධ අරමුදලට සිදු වී තිබුණි.

(ඈ) අපි වෙනුවෙන් අපි අරමුදල නමින් වෙනම ව්‍යවස්ථාපිත අරමුදලක් පිහිටුවා තිබියදී සහ එහි ප්‍රමාණවත් අරමුදල් තිබියදී එම අරමුදල මගින් පුත්තලම් දිස්ත්‍රික්කයේ ඉදිකළ නිවාස ප්‍රදානය කිරීමේ උළෙල සඳහා වේදිකාගාර , උපකරණ හා උත්සව භාණ්ඩ කුලී ගාස්තු වෙනුවෙන් පෞද්ගලික සමාගමකට රු. මිලියන 3.7 ක් අමාත්‍යාංශයේ වැය ශීර්ෂයෙන් ගෙවා තිබුණි. ඉහත සේවාව ලබා ගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.1 මාර්ගෝපදේශය ප්‍රකාරව ලංසු කැඳවීමක්ද සිදු කර නොතිබුණි.

## 3.16 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 55 | 45 | 10 |
| (ii) | තෘතියික මට්ටම | 17 | 9 | 8 |
| (iii) | ද්විතියික මට්ටම | 261 | 174 | 87 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 156 | 119 | 37 |
| | **එකතුව** | **489** | **347** | **142** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

නිලධාරීන් හා සේවකයින් 52 දෙනකු වර්ෂ 7 ක සිට වර්ෂ 30 ක් දක්වා කාල පරාසයක සිට ස්ථාන මාරුවීම් ලබා දීමකින් තොරව අමාත්‍යාංශයේ රඳවා ගෙන තිබුණි.

### (ආ) වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත්

සන්නද්ධ හමුදාවල නිලධාරීන් 53 දෙනෙකුද, සෙසු නිල සාමාජිකයන් 204 දෙනෙකුද, නිල ඇඳුම් නොවන 34 දෙනෙකු ද, අමාත්‍යාංශයේ රාජකාරි සඳහා අනුයුක්ත කර තිබුණි. සේවයේ යොදවා ඇති මෙම කාර්ය මණ්ඩලවල අමාත්‍යාංශයට අනුයුක්ත කිරීම සම්බන්ධ යාවත්කාලීන කළ දත්ත පද්ධතියක් අමාත්‍යාංශය සතුව නොතිබුණි.